- 774

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන 2022/2023

5 වන මට්ටම - අවසාන පරීක්ෂණය

EPU5354 - ප්‍රාථමික අධ්‍යාපනය සඳහා සෞන්දර්යය

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2024.03.02 | වේලාව - පෙ.ව. 9.30. - පෙ.ව.11.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 - වන කොටස

01. "සෞන්දර්ය විෂයයන් යනු ළමා ඉගෙනීම උත්තේජනය කරන සහ වැඩි දියුණු කරන සුවිශේෂ සම්පත් වේ."

    උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

02. සෞන්දර්යාත්මක වටිනාකම්වල වැදගත්කම

    (i.) පුද්ගලයාට සහ
    (ii.) සමාජයට

    දායක වන අයුරු සාකච්ඡා කරන්න.

03. ප්‍රාථමික පාසල් සිසුන්ගේ අධ්‍යාපනික සංවර්ධනය සඳහා සෞන්දර්යාත්මක අධ්‍යාපනයේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

04. ගාඩ්නර් (1983) ට අනුව, කායික/ චාලක බුද්ධිය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

05. දරුවන් තුළ නර්තන කුසලතා සංවර්ධනය කිරීමේදී නිවසෙන් ලැබෙන දායකත්වය කෙටියෙන් පැහැදිලි කරන්න.

06. ළමා චිත්‍ර අධ්‍යානයේදී ගුරුවරයෙකු විසින් සැලකිලිමත් විය යුතු කරුණු කෙටියෙන් විස්තර කරන්න.

07. නිර්මාණශීලී ප්‍රාථමික ගුරුවරයෙකු ලෙස ඔබ වැඩිදියුණු කළ යුතු ගුණාංග කෙටියෙන් විස්තර කරන්න.

08. "නාට්‍ය" යන්න ඔබේ වචනයෙන් නිර්වචනය කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 02 - කොටස

09. (i.) සමාජයට සංවේදී දරුවෙකු දායාද කිරීම සඳහා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් හරහා නාට්‍ය සහ රංග කලාව යොදා ගත හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු - 10)

(ii.) දරුවන් තුළ සදාචාරාත්මක හැසිරීම් සංවර්ධනය කිරීමට යොදා ගතහැකි ක්‍රමයක් ලෙස "කතන්දර කීම " හැඳින්විය හැක.

ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද? ඔබේ පිළිතුර උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු - 10)

10. (i.) ප්‍රාථමික සිසුන්ට සංගීතය සහ චලනයෙන් ලැබෙන ප්‍රතිලාභ උදාහරණ සමඟින් පැහැදිලි කරන්න.? (ලකුණු - 10)

(ii.) ප්‍රාථමික අධ්‍යාපනයේ සංගීතය සහ චලනය සඳහා පහසුකම් සැලසීමේදී ගුරුවරයාගේ කාර්යභාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු - 10)

11. (i.) ප්‍රාථමික අධ්‍යාපනයේ ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා නාට්‍ය ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ වැදගත්කම සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු - 10)

(ii.) "කුඩා දරුවන්ගේ චිත්තවේගීය පසුබිම හඳුනා ගැනීමට ළමා චිත්‍ර භාවිතා කළ හැකිය."

ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද? උදාහරණ සමඟ ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු - 10)

12. (i.) "ප්‍රාථමික පාසලේ සෑම විෂයයක්ම සෞන්දර්යාත්මක හැකියාවන් සංවර්ධනය කිරීමට අවස්ථා සලසා දෙයි."

ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද? උදාහරණ සමඟ ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු - 10)

(ii.) ප්‍රාථමික පන්ති කාමරයේ සෞන්දර්ය අධ්‍යාපන ක්‍රියාකාරකම් සමෝධානය කිරීමේදී ගුරුවරුන් මුහුණ දෙන අභියෝග උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු - 10)

13. (i.) දෛනික ජීවිතයේ සෞන්දර්ය අත්දැකීම් සඳහා කුඩා දරුවන්ට අත්වැල් සැපයීමේදී වැඩිහිටියන්ගේ කාර්යභාරය උදාහරණ සමඟ සාකච්ඡා කරන්න. (ලකුණු - 10)

(ii.) ප්‍රාථමික ශ්‍රේණියක පාඩමක ඕනෑම තේමාවක් යටතේ සෞන්දර්යාත්මක සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරකම් දෙකක් **(02)** ඇතුළත් පාඩම් සැලැස්මක් සකස් කරන්න. සෑම ක්‍රියාකාරකමකටම පහත සඳහන් දේ ඇතුළත් විය යුතුය.

ශ්‍රේණිය, විෂය, තේමාව, ඉගෙනුම් ප්‍රතිඵල, ඉගැන්වීම් ආධාරක, අධ්‍යයනයේ පියවර සහ ඇගයීම. (ලකුණු - 10)

- හිමිකම් ඇවිරිණි. -